Law & Society Trust

ESCR Newsletter

ISSUE 13, MARCH, 2015

## ‘අම්මේ මම ආයෙ ගෙදර එන්නේ නෑ’ - වවුනියා ප්‍රදේශයේ වූ අතුරුදන්වීම් පිළිබඳව සිදුකරන ලද ප්‍රසිද්ධ නඩු විභාගයක මතක සටහන්



**Image : Vikalpa/ CPA**

වෙනදට වඩා අසාමාන්‍ය ලෙස කාර්ය බහුල වූ එක් සඳුද උදෑසනක වවුනියාවේ වෙට්ටිකුලම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපස රැස්වූ කුඩා කණ්ඩායමක් විය. බහුතරය කාන්තාවන් වූ මෙම කුඩා කණ්ඩායම ආරාධනා ලිපි ද අත දරාගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපස සිටගෙන සිටියහ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට එම ලිපියෙන් ගෙන ආවේ බලාපොරොත්තුවක ඡායා මාත්‍රයකි. අතුරුදන්වූවන්ගේ පවුල්වල සාමාජිකයින් වශයෙන් ඔවුන් මෙසේ රැස්ව සිටියේ 2014 අගෝස්තු 15 වන දින පිහිටවනු ලැබූ, අතුරුදන්වීම් පිළිබඳව වන ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ තමන්ගේ සාක්ෂි සහ ප්‍රකාශ ලබාදීමටය. මෙම කොමිෂන් සභාව, 1983 ජනවාරි පළමු වනදා සිට 2009 මැයි දහනව වනදා අතර කාල සීමාව තුළදී සිදුවූ පැහැර ගැනීම් සහ අතුරුදන්වීම් සම්බන්ධයෙන්, එසේ අතුරුදන්වූ පුද්ගලයින් පිළිබඳ හෝඩුවාවන්, එම වරද සිදු කරන්නට ඇතැයි සිතිය හැකි පුද්ගලයින්, වරදකරුවන්ට එරෙහිව ගතහැකි නෛතික ක්‍රියාමාර්ග, අනාගතයේදී මෙවන් වරදවල් නැවත සිදුකිරීම වැළැක්වීමට ගතහැකි ක්‍රියාමාර්ග සහ වින්දිතයින්ගේ පවුල්වල සාමාජිකයින්ට ලබාදිය හැකි වන්දි හෝ සහන යනාදී කරුණු පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීමේ බලවරම සහිතව ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් ඇති කරන ලද්දකි.

එහි ආරම්භයේ සිට මේ දක්වා කොමිෂන් සභාව විසින් පැමිණිලි 20,000 කට අධික සංඛ්‍යාවක් භාරගෙන තිබේ. මෙම පැමිණිලි 1983 වැලිකඩ බන්ධනාගාරයේ සිදුකළ මරාදැමීම්වල සිට 2009 වර්ෂයේදී අතුරුදන්වූ පුද්ගලයින් දක්වා වූ පුළුල් පරාසයක වන පැමිණිලි වේ.

අතුරුදන්වීම් සම්බන්ධයෙන් එසේ සිදුකර අවසන් කරන ලද ප්‍රසිද්ධ නඩු විභාග නවයම ඛේදනීය, වේදනාත්මක මෙන්ම තම ආදරණීයයන් සොයා ගැනීමේ අරමුණින් පවුල් විසින් සිදුකරන අඛණ්ඩ සෙවීම් පිළිබඳ විස්තරයන්ගෙන් පිරී තිබුණි. වවුනියාවේ පවත්වන ලද නඩු විභාගයේදී සන්නද්ධ හමුදා, එල්ටීටීඊ සංවිධානය, පැරා මිලිටරි කණ්ඩායම් විසින් සුදු වෑන් මඟින් සිදුකළ අතුරුදන් කිරීම් හා නාඳුනන පුද්ගලයින් විසින් සිදුකළ අතුරුදන් කිරීම් රටා පිළිබඳව අවධාරණය කරන ලදී. හමුදාව පැමිණ ඔහු රැගෙන යන අවස්ථාවේදී *සුබ්‍රමනියම් රන්ජිත්කුමාර්ගේ* වයස අවුරුදු 17 ක් පමණක් විය. ඔහුගේ මව පවසන අන්දමට, 2008 ජුනි 3 වන දින ඔහු කෝවිලේ සිට ආපසු පැමිණ නිවසේ නිදාගෙන සිට තිබේ. ඔවුන්ගේ නිවස කරා යුධ හමුදා බෆල් රථයක් පැමිණ ඇති අතර, ඔහුව නිවසෙන් එළියට ඇද බෆල් රථය තුළට දමාගෙන රැගෙන ගොස් තිබේ. එදිනම, ඇගේ සහෝදරයාවද බෆල් රථයක දමාගෙන රැගෙන ගිය බව ඇය විසින් පවසන ලදී. ඔවුන් දෙදෙනාම රැගෙන ගොස් ඇත්තේ ජෝසෆ් යුධහමුදා කඳවුරටය. මීළඟ දිනයේදී ඇගේ සහෝදරයාව ඉන් නිදහස් කර තිබේ. ඔහු තම බෑණනුවන් පිළිබඳ විමසා සිටි විට එක් හමුදා නිලධාරියකු විසින් ඔහුගේ මුහුණ ජලය සහිත බාල්දියකට ඔබමින් පවසා ඇත්තේ, ඔවුන් ළමයාව නිදහස් නොකරන බවය. ආපසු පැමිණ මෙම කථාව විස්තර කළ ඇගේ සොයුරා හැකි ඉක්මනින් ඉන්දියාවට ගොස් තිබේ. පුද්ගලයින් පැහැරගැනීම සඳහා හමුදාව විසින් ‘බෆල්’ රථ යොදාගත් අවස්ථාවන් පිළිබඳව බොහෝ දෙනෙක් විසින් මීට සමාන කථා පවසා තිබේ.

*කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබාදීමට පැමිණි එක් කාන්තාවක් ජනවාර්ගික යුද්ධයේ විවිධ අදියරයන්හීදී තම සහෝදරයින් තුන්දෙනා අහිමිවී ගිය අන්දම විස්තර කළාය.*

*ඇගේ මුල්ම සහෝදරයා අතුරුදන් වූයේ 1980 වර්ෂයේදී තම සුපුරුදු දිනචරියාවේ අංගයක් ලෙස වෙළෙඳපොළට ගිය අවස්ථාවකදීය.*

*දෙවන සහෝදරයා අතුරුදන් වූයේ 1980 ගණන්වලදී ඔවුන්ගේ පවුල වවුනියා ප්‍රදේශයේ අවතැන්ව සිටින කාලයේදීය. ඔහු අතුරුදන් වී මාසයක් ගතවූ පසු වැලිකඩ බන්ධනාගාරය දක්වා ඔහුගේ ආගිය තොරතුරු සොයාගන්නට ඔවුන්ට හැකිවී තිබේ. ස්නානය හා සේදුම සඳහා අවශ්‍ය කරන සබන් සහ අනෙකුත් ද්‍රව්‍ය ලබාදෙන ලෙස ඉල්ලමින් ඔවුන්ගේ සොයුරා විසින් ලියන ලද ලිපියක් 1983 ජූලි 23 වනදා ඔවුනට ලැබී තිබේ. ඉන් දින තුනකට පසුව ඔහුගේ මරණය පිළිබඳව ගුවන්විදුලියේ නිවේදනයක් ප්‍රචාරය වී තිබේ. දෙමළ ජාතික සිරකරුවන් 52කගේ ජීවිත බිල්ලට ගත් 1983 බන්ධනාගාර කැරැල්ල සිදුවන අතර ඔහු මියගොස් ඇති බව එහි සඳහන්ව තිබිණි. තම සොයුරාගේ මෘත ශරීරය ලබාගන්නට එම පවුලට කිසිවිටක අවස්ථාවක් ලබා දී නොතිබිණි.*

*1990 වර්ෂයේ වූ ඇඳිරිනීති සමයේදී ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් තුන්වන සහෝදරයාව රැගෙන ගොස් තිබේ. මඩුකන්ත කඳවුරේ තබා ඇති ඇගේ සහෝදරයාගේ සිරුර එහි පැමිණ හඳුනාගැනීමට ඇයට හැකි බව දැනුම්දෙමින් ලැබුණු පණිවුඩයක් අනුව, ඔහු සොයාගැනීම සඳහා ඇය ඇගේ ස්වාමිපුරුෂයාව එහි යවා ඇත. කෙසේනමුත්, යුධ හමුදාව විසින් ඇගේ සැමියාට පහරදී ඔහුව බංකරයක් අසල අතහැරදමා ගොස් තිබිණි. ඔහු ලබා තිබූ තුවාල කෙතරම් දරුණුද යත්, සුවය පතා ඔහුව ඉන්දියාවේ ප්‍රතිකාර සඳහා යවන්නට සිදුව තිබේ. ලැබූ තුවාල වල ප්‍රතිඵලයක් ලෙස ඔහු එහිදී මියගිය බව ඇය පැවසුවාය.*

එල්ටීටීඊ සංවිධානය විසින් ඔහුව රැගෙන යන විට *සතාසිවම් ලෝගේස්වරන්* අවුරුදු 19 ක තරුණයෙක් විය. 2008 පෙබරවාරි මාසය දක්වා ඔහුව හමුවීමට ඔහුගේ මවට ඉඩ ප්‍රස්තාව ලැබී තිබුණත් ඉන් අනතුරුව ඔහු අතුරුදන් වී තිබේ. ත්‍රස්ත විමර්ශන අංශයේ (ටීඅයිඩී) නිලධාරීන් යනුවෙන් තමන්ව හඳුන්වාගත් පුද්ගලයින් දෙදෙනෙකු එක් අවස්ථාවකදී ඇයගේ නිවසට පැමිණ කොටි නිල ඇඳුමෙන් සැරසී සිටි ඇගේ පුතාගේ ඡායාරූපයක්

සහිත ලිපිගොනුවක් ඇයට පෙන්වීමත් සමඟින් තම පුත්‍රයා පිළිබඳව ඇය තුළ වූ බලාපොරොත්තු යළි අලුත් වී තිබේ. කොටි නිල ඇඳුමකින් සැරසී පුතා ගත් ඡායාරූපයක් තමන් විසින් කිසිවකුටත් ලබාදී නොමැති බව සඳහන් කළ ඔහුගේ මව පැවසූයේ, මෙම ඡායාරූපය පසුව ගත් එකක් වියහැකි බවයි. තමන්ගේ පුතා කොහේ හෝ ජීවත්ව සිටින බව තමන් තදින්ම විශ්වාස කරන බව ඇය විසින් පැවසුවාය. එල්ටීටීඊ සංවිධානය විසින් සිදුකරන ලද පැහැර ගැනීම් බහුතරයක් වාර්තා වී ඇත්තේ 2002 සිට 2007 දක්වා වූ කාලපරිච්ඡේදය අතරතුරදී වේ.

සුදු වෑන් රථ මගින් පුද්ගලයින් පැහැරගත් අවස්ථාවන් පිළිබඳව ද වාර්තා වී තිබේ. මෙම සුදු වෑන්රථ සම්බන්ධ සිද්ධීන් බහුතරයක් වාර්තා වී ඇත්තේ වින්දිතයාගේ නිවස හෝ සේවා ස්ථානය ආසන්නයේදී සිදුවූ සිදුවීමක් ලෙසින්ය. සාක්ෂි ලබාදුන් සියලුම පුද්ගලයින්ට අවශ්‍යව තිබූ කාරණාව වූයේ අතුරුදන්ව ඇති තම ඥාතීන් පිළිබඳව හෝඩුවාවක් දැන ගැනීමයි. තමන්ට යම්කිසි වන්දියක් ලැබුණේදැයි කොමසාරිස්වරුන් විසින් විමසා සිටි අවස්ථාවේදී බොහෝ කාන්තාවෝ හඬා වැටෙන්නට පටන් ගත්හ. ඉන් එක් කාන්තාවක් පැවසූයේ 'මට වෙන කිසිම දෙයක් එපා, මට මගේ පුතාව විතරයි ඕනෑ කරන්නේ' යනුවෙනි.

කොමිෂන් සභාවේ වෙබ් අඩවියට අනුව, ඔවුන්ට ලැබුණු අයදුම්පත් 20,000 අතරින් සිද්ධි 1440 කට අදාළ නඩු විභාග කර, අවසන් කරන්නට වර්ෂයක් ගතවන විට කොමිෂන් සභාවට හැකිවී තිබේ. ඉදිරි අනාගතයේදී කොමිෂන් සභාව විසින් සම්පූර්ණ කර අවසන් කළ යුතු අතිමහත් වැඩ ප්‍රමාණය මෙම සංඛ්‍යාවෙන් මනාව පැහැදිලි වන අතර, සිදුවීම් 20,000කට සමාන ප්‍රමුඛතාවයක් ලබාදෙමින්, සෑම ප්‍රසිද්ධ නඩු විභාගයකටම සහභාගී වෙමින් ඒ කටයුතු සියල්ල නිසි පරිදි සම්පූර්ණ කිරීම සාමාජිකයින් තුන් දෙනෙකුගෙන් යුත් කොමිෂන් සභාවකට කළ හැකිවේද යන ප්‍රශ්නය මෙහිදී පැන නගී.

සාක්ෂි සටහන් කර ගැනීම සඳහා එක් එක් සාක්ෂිකරුවාට සාමාන්‍යයෙන් මිනිත්තු 8 සිට 15 දක්වා කාලයක් වෙන් කර තිබුණි. අතුරුදන් වූ පුද්ගලයින්ගේ ඉරණම කුමක් වීද යන්න පිළිබඳව සොයා බැලීම සඳහා සිදුකරන විමර්ශනයක් සඳහා භාවිතා කිරීමට තරම් ප්‍රමාණවත් අන්දමේ සවිස්තරාත්මක ප්‍රකාශයක් සටහන් කරගැනීමට මෙම කාලය ප්‍රමාණවත් වේද? යුද්ධයේ අවසන් අදියරයන් හිදී සිදුවූ බවට චෝදනා කෙරෙන සිවිල් වැසියන්ගේ මරණ හා මානුෂීය නීති උල්ලංඝන පිළිබඳවද විමර්ශනය කළ හැකි වන පරිදි කොමිෂන් සභාවට ලබාදී තිබූ බලවරම තවදුරටත් ව්‍යාප්ත කරන්නට 2014 වසරේ ජූලි මාසයේ සිදුකරන ලද ගැසට් නිවේදනයක් හරහා කටයුතු කරන ලදී. ඒ වන විටත් කොමිෂන් සභාවට භාර වී තිබුණු දුරිය නොහැකි තරම් විශාල වූ වැඩ ප්‍රමාණය සලකා බලන කල එහි බලවරම තවදුරටත් පුළුල් කිරීම තුළින් ලබාගත හැකි වන්නේ කුමන අන්දමේ විශ්වාසනීය ප්‍රතිඵලයක්ද?

දෙවැනි වැදගත් ප්‍රශ්නය වන්නේ මේ දක්වා ශ්‍රවණය කරන ලද සහ වාර්තා කරගන්නා ලද සාක්ෂි කරුවන්ගේ ප්‍රකාශවල ඇතුලත් තොරතුරු වලින් උකහා ගත් යම් කරුණක් පිළිබඳ වැඩිදුරටත් පරීක්ෂණ සිදුකරනු ලබන්නේද යන්නයි. මේ වන විට යම් සැකකරුවන් හඳුනාගෙන තිබේද? එසේ ඔවුන් හඳුනාගෙන තිබේ නම් කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රසිද්ධියේ සාක්ෂි ලබාදීම සඳහා ඔවුන්ව කැඳවනු ලබන්නේ කුමන දිනයකදීද? 2015 පෙබරවාරි මාසයේදී නිකුත් කිරීමට නියමව ඇති කොමිෂන් සභාවේ පළමුවන වාර්තාව නිකුත් කරන අවස්ථාවේදී එමගින් ආමන්ත්‍රණය කළ යුතුවන ප්‍රශ්න කිහිපයක් ලෙස මේවා සඳහන් කළ හැකිය.

රජය මාරු වීමත් සමගින් මෙම කොමිෂන් සභාවේ බලවරම යළි ඇගයීමට ලක්කර එහි කටයුතු කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදය සමාලෝචනය කෙරෙනු ඇතැයි යම් බලාපොරොත්තුවක් පැවතුණි. කෙසේ නමුත් මීට පෙර සිටි ජනාධිපතිවරයා විසින් ලබාදුන් බලවරම අනුව කොමිෂන් සභාව දනටත් කටයුතු කරමින් සිටිනු ලැබේ. 2015 වර්ෂයේ මාර්තු මස ආරම්භයේදී ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පැවති කොමිෂන් සභා විභාගයේදී පෙනෙන්නට තිබුණු අයුරින් මෙහි බරපතල ප්‍රතිවිපාක ගණනාවක් ඇත. එහිදී කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට පැමිණ සිටියේ ඒ සඳහා ආරාධනා කෙරුණු පුද්ගලයින්ගෙන් අඩකටත් වඩා අඩු ප්‍රමාණයකි. ශ්‍රී ලංකා රජයේ ''තවත් අසාර්ථක යන්ත්‍රණයක්'' ලෙසින් සියලු දෙනාම එය සැලකීමට පටන්ගැනීමට පෙර මෙම කොමිෂන් සභාවේ ඇති අඩු ලුහුඬුකම් ආමන්ත්‍රණය කිරීමේ හදිසි අවශ්‍යතාවයක් පැන නැගී තිබේ.

කොළඹ සිට වවුනියාව දක්වා ගමන් කරමින් සිටින අතරතුරදී නන්නාඳුනන පුද්ගලයින් විසින් පැහැරගැනීමට ලක්වූ කනපති දයාලකන්දන්ගේ වයස එවකට අවුරුදු 27ක් විය. මෙකී සිදුවීම සිදුවූ දිනයේදී ඔහු තම ගමන පිළිබඳව දිගින් දිගටම මව දැනුවත් කරමින් සිටියේය. ඔහු මැදවච්චි ප්‍රදේශය පසුකරමින් සිටින අවස්ථාවේදී ඔහුගේ මව තම පුතාගෙන් ලද අවසන් දුරකථන ඇමතුම ලැබුවාය. එම අවස්ථාවේදී යමෙකු ඔහු පසුපස සිට ඔහුට තර්ජනය කරමින් සිටි බවත් ඔහු හඬා වැටෙමින් දුරකථනයෙන් තමන් සමඟ කථා කල බවත් ඇය පැවසුවාය. 'මට පුතාගේ කටහඬ ඇසුණු අවසන් වතාව එයයි' ඇය හඬමින් පැවසුවාය. ඒ අවස්ථාවේදී ඇගේ පුතා ප්‍රකාශ කර ඇත්තේ, 'අම්මේ මම ආයේ ගෙදර එන්නේ නෑ' යනුවෙනි.

ස්වස්තිකා ආරුලිංගම්[1]

## චුන්නාකම් අර්බුදය: මානව හිමිකමක් ලෙස ජලය



**Image : Vikalpa/CPA**

රතුපස්වල ප්‍රදේශයේ පවත්වන ලද විරෝධතාවයන්හි ප්‍රතිඵලයක් ලෙස වැලිවේරියේ සිදුවූ මහත් ව්‍යසනකාරී සිදුවීම් සහ හඳුනා නොගත් රෝග නිධානයකින් හටගන්නා වූ නිදන්ගත වකුගඩු රෝගයට (CKDu) මුහුණ දෙන්නට සිදුවූ ගොවීන් දහස් ගණනක් මියයන්නට වීම සමාජ ආර්ථික අයිතිවාසිකම් පිළිබඳව වන කථිකාව පෙරමුණට ගෙන ඒමට හේතු වී ඇත.

[1] නීතිඥ

මෙම ව්‍යසනකාරී සිදුවීම් පෙළෙහි නවතම සිදුවීම වන්නේ චුන්නකම් විදුලි බලාගාරය සම්බන්ධයෙන් ඇතිවී තිබෙන ජල අර්බුදයයි. උතුරු පළාතේ චුන්නාකම් ප්‍රදේශයේ ඇති ලංකා විදුලිබල මණ්ඩල පරිශ්‍රය තුළ ක්‍රියාත්මක වන විදුලි බලාගාරය (Northern Power Plant) මගින් බැහැර කෙරෙන අපවිත්‍ර තෙල් හේතුවෙන් එම පළාතේ පොළොව යටින් දිවෙන දිය උල්පත් දූෂණය වන බවට චෝදනා එල්ලවී තිබේ.[2] ප්‍රදේශයේ පවුල් දසදහසකට අධික සංඛ්‍යාවක් මෙයින් බලපෑමට පත්වන බවක් සඳහන් වේ.[3] තම දෛනික අවශ්‍යතා වන සේදීම, ස්නානය සහ ආහාර පිසීම යනාදී කටයුතු සඳහා එම ජලය භාවිතයෙන් වළකින ලෙස ප්‍රදේශවාසීන්ට උපදෙස් ලබාදී තිබේ.[4] ජලයේ ඇති අහිතකර බලපෑම මිනිසුන්ගේ සෞඛ්‍යය තත්ත්වයට මෙන්ම භෝග අස්වැන්නට හා ගහකොළටද බලපවත්වන හෙයින්, බහුතරයක් පවුල්වල ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන ගොවිතැන් වගාවන්හි නියැලීම සඳහා එම ජලය භාවිතා කිරීමටද ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට නොහැකිවී තිබේ.[5]

බලාගාරයෙන් බැහැර කෙරෙන අපද්‍රව්‍ය මිශ්‍රිත තෙල් ඉහළින් සවිකර ඇති ටැංකි වලට එක් රැස් කරන බවත්, කිසිවක් පොළොවට මුදා නොහරින බවත්, පාරිසරික බලපත්‍ර හා අනුමැතිය නිසි පරිදි වාර්ෂිකව නිකුත් කර ඇති බව හා අදාළ ත්‍රෛමාසික පරීක්ෂා කිරීම් නියමාකාරයෙන් සිදුකෙරෙන බවත් සඳහන් කරන සී/ස නොදර්න් පවර් පෞද්ගලික සමාගම තමන්ට එරෙහිව එල්ලවී ඇති මෙකී චෝදනාවන්හි වලංගුභාවය දිගින් දිගටම ප්‍රතික්ෂේප කරනු ලබයි.[6] මෙම ගැටළුව සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතුණද විදුලි බලාගාරය අඛණ්ඩව ක්‍රියාත්මක වේ.[7] විදුලි බලාගාරය දිගින් දිගටම ක්‍රියාත්මක වීමට එරෙහිව විරෝධතා පළකරන්නෝ ජලය දූෂණය වීමේ ප්‍රශ්නය සඳහා ස්ථිර විසඳුමක් ලබාදිය යුතු බව ඉල්ලා සිටිති.[8] ජලය සඳහා ඇති අයිතිවාසිකම පිළිබඳව ජාත්‍යන්තර නීති ව්‍යාවහාරය සමාලෝචනය කර, ශ්‍රී ලංකාවේ පවතින නීති පද්ධතිය තුළ එවන් අයිතිවාසිකමක් බලාත්මක කිරීම කෙතරම් දුරකට සිදුකළ හැකිවේද යන්න විශ්ලේෂණය කිරීමේ අරමුණින් මෙම ලිපිය ලියැවී ඇත.

## ජලය සඳහා වන අයිතිය සහ ජාත්‍යන්තර නීතිය යටතේ ඒ සම්බන්ධයෙන් රජයට ඇති බැඳීම්

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිවිද්‍යාව තුළ ජලය සඳහා වන අයිතිවාසිකමට ලබාදී ඇති පිළිගැනීම, මානව හිමිකම් එකිනෙක හා බැඳී පවතින බවත්, එකිනෙක මත රඳාපවත්නා බවත් මනාව පෙන්නුම් කරන්නා වූ එක් උදාහරණයකි. ජලය සඳහා වන අයිතිවාසිකම ප්‍රකාශ කෙරෙන 15 වන පොදු අර්ථකථනය (General Comment 15) මගින් එය මානව ගරුත්වය සහිත ජීවිතයක් ගතකිරීමේදී අත්හළ නොහැක්කක් ලෙස හා අනෙකුත් මානව හිමිකම් සාක්ෂාත් කරගැනීමට සම්පූර්ණ කරගතයුතු පූර්ව අවශ්‍යතාවයක් ලෙසින් සලකනු ලැබේ.[9] ඒ අනුව ජලය සඳහා වන

[2] óNorthern power plantôs waste oil contaminates regionôs water supplyô, සන්ඩේ ටයිම්ස් පුවත්පත, 2015 ජනවාරි 18

[3] -එම-

[4] -එම-

[5] -එම-

[6] óJaffna Power Plant Rejects Claimsô, කලම්බෝ ගැසට්, 2015 ජනවාරි 20

[7] óJaffna school kids protest against Chunnakam power plant oil spillageô, ටැමිල් ගාර්ඩියන්, 2015 ජනවාරි 21

[8] -එම-

[9] එක්සත් ජාතීන්ගේ ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳව කමිටුව (CESCR), පොදු අර්ථකථන අංක 15: ජලය සඳහා වන අයිතිය (ප්‍රඥප්තියේ 11 වන හා 12 වන වගන්ති), 2003 ජනවාරි 20, E/C.12/2002/11, 1 වන පරිච්ඡේදය

අයිතිවාසිකම, සෑහෙන ජීවන තත්ත්වයක් සඳහා වුවමනා කෙරෙන අත්‍යාවශ්‍ය අංගයක් ලෙස ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ අර්ථ කථනයට ඇතුළත් වන්නක් ලෙස සලකනු ලැබීය.[10] ඒ අනුව ජලය සඳහා වන අයිතිවාසිකම සහ ලබාගතහැකි උපරිම ශාරීරික සෞඛ්‍යය තත්ත්වයක් භුක්තිවිඳීම පිණිස සියලු දෙනාටම ඇති අයිතිවාසිකම එකිනෙක සමඟින් සම්බන්ධ ඒවා වේ.[11] මෙම අයිතිවාසිකම පූර්ණ වශයෙන් සාක්ෂාත් කරගැනීමට නම්, පාරිසරික සහ කාර්මික ස්වස්ථතාවයේ සියලුම අංග වැඩිදියුණු කිරීමට මෙන්ම වෘත්තීය හා බැඳුණු රෝග හා අනෙකුත් ලෙඩ රෝග නිවාරණයටත්, ඒවාට ප්‍රතිකාර කිරීමටත්, ඒවා පාලනය කිරීමටත් රජය විසින් ක්‍රියාමාර්ග ගතයුතු වේ.[12] තවද, ආරක්ෂිත සහ සෞඛ්‍යය සම්පන්න සේවා තත්ත්වයන්ද ඇතුළත් වන්නා වූ සාධාරණ හා සුදුසු සේවා තත්ත්වයන් යටතේ සේවය කිරීමට ඇති අයිතිවාසිකම පිළිගැනීමට ලක්කිරීම තුළින්ද පිරිසිදු ජලය සඳහා ප්‍රවේශවීමේ හැකියාව යන අයිතිවාසිකම විද්‍යාමාන කෙරේ[13].

මෙම අයිතිවාසිකම මඟින් ජලය දූෂණයෙන් පීඩාවට ලක් නොවී සිටීමේ නිදහස සඳහා පුද්ගලයාට හිමිකමක් ලබාදෙන අතරම,[14] අනෙක් අතට පෞද්ගලික සහ ගෘහස්ථ භාවිතය සඳහා අවශ්‍ය කරන ජලය ආරක්ෂිත වන බව සහතික කරගැනීම සඳහා ජලයේ ගුණාත්මක බව අධීක්ෂණය කිරීමේ වගකීමක්, එනම් ක්ෂුද්‍ර-ජීවීන්ගෙන්, රසායනික ද්‍රව්‍යයන්ගෙන් සහ විකිරණශීලී උවදුරුවලින් තොර වන බවට සහතික කරගැනීමේ වගකීමක් රජය මත පනවනු ලැබේ.[15] තවද, නිවසේ සිට අපහසුවකින් තොරව ළඟාවියහැකි දුර සීමාවක් තුළ ජලය ලබාගැනීමේ ස්ථාන පිහිටා තිබෙන බවත්, අන් කටයුතු වලට බාධාකාරී වන අන්දමින් රැඳී සිටින්නට සිදුවීම වළක්වාලීමට ප්‍රමාණවත් තරම් එවැනි ස්ථාන සංඛ්‍යාවක් පවතින බවත් ඇතුළුව ප්‍රමාණවත් තරම් ජලය ආරක්ෂිතව සහ නිරන්තරයෙන් ලබාගතහැකි පහසුකම් හෝ සේවාවන් වෙත භෞතික ප්‍රවේශය ලබාදීම හරහා එවන් හදිසි අවස්ථාවකදී පවා එකී අයිතිවාසිකමේ අවම මූලික හරය හෝ සහතික කර දීමේ වගකීමක් රජය සතු වේ.[16]

ජලය සඳහා වන අයිතිවාසිකම ආරක්ෂා කිරීම සඳහා රජයට ඇති බැඳීමට සමාගම් විසින් ජල සම්පත දූෂණය කිරීම වළක්වාලීමද ඇතුළත්ය.[17] සමාගම්වලට සෘජුවම අදාළ වන මානව හිමිකම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතියෙන් සකස් කරන ලද්දවූ බැඳිමක් ඇති නොකරන මාර්ගෝපදේශයන් තිබේ. එසේ සකස් කර ඇති එක්සත් ජාතීන්ගේ ව්‍යාපාර හා මානව හිමිකම් පිළිබඳ මාර්ගෝපදේශ මූලධර්මයන්ට (UN Guiding Principles on Business and Human Rights) අනුව, ඔවුන්ගේ ක්‍රියාකාරකම් මගින් සෘජුව හෝ වක්‍රාකාරයෙන් මානව හිමිකම් උල්ලංඝනයට දායකත්වය නොසපයන බව සහතික කරගැනීමට නිසි උද්යෝගයෙන් යුතුව කටයුතු කිරීම සඳහා සංස්ථාපිත ආයතනයන්ට බැඳීමක් ඇත.

[10] එම, 3 වන පරිච්ඡේදය

[11] එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය, ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය, 1966 දෙසැම්බර් 16, එක්සත් ජාතීන්ගේ සංවිධානය, සන්ධාන ග්‍රන්ථ මාලාව, 993 වෙළුම, පි. 3, 12 වන වගන්තිය; එම; 8 වන පරිච්ඡේදය

[12] -එම-

[13] ඉහත 10, 7 වන වගන්තිය

[14] ඉහත 8, 10 වන වගන්තිය

[15] ඉහත 8, 12 වන වගන්තිය

[16] එම, 37 ඡේදය

[17] එම, 23 ඡේදය.

ඔවුන්ගේ මෙහෙයුම් කටයුතු සිදුකෙරෙන ඕනෑම ස්ථානයකදී එසේ මානව හිමිකම්වලට ගරු කිරීමේ ආයතනික වගකීම ඔවුනට අදාළ වේ. මෙම බැඳීම, තම රට තුළ මානව හිමිකම් සම්බන්ධ බැඳීම් ඉටුකිරීමට යම් රජයක් සතු හැකියාව සහ ඔවුන්ගේ ඊට ඇති කැමැත්ත සමඟින් කිසිසේත්ම සම්බන්ධ නොවන්නකි.

එමනිසා, තම ක්‍රියාකාරකම් මඟින් මානව හිමිකම් වලට ඇතිවන බලපෑම පිළිබඳව දැනුවත්ව සිටීම සඳහා පැහැදිලි බැඳීමක් සමාගම් සතුව පවතියි. සමාගම් විසින් තමන්ගේ ක්‍රියාකාරකම් හා ව්‍යාපාර සබඳතාවන් මඟින් සිදුවන බලපෑම පිළිබඳව අභ්‍යන්තර ඇගැයුමක් සිදුකළ යුතුය යන බැඳීමක් ද නිසි උද්යෝගයෙන් යුතුව කටයුතු කිරීමේ අවශ්‍යතාවයට ඇතුළත් වේ. එවන් අවදානම් ඇගැයුමක් සිදුකරන්නේ නම් එය සමාගමේ අභ්‍යන්තර සහ බාහිර මානව හිමිකම් විශේෂඥයින්ගේ අදහස් ද ලබාගනිමින්, සමාගමේ ක්‍රියාකාරකම් හේතුවෙන් බලපෑමට ලක්වියහැකි පුද්ගලයින් සහ පාර්ශ්වකරුවන්ගේ අදහස් ද අර්ථවත් ලෙස ලබාගනිමින් සිදුකළයුතු වේ. මෙහිදී චුන්නාකම් ජල අර්බුදයට සම්බන්ධ පාර්ශ්වකරුවන් විසින් භාවිතා කර ඇති එකිනෙකාට එදිරිවාදී වූ ක්‍රමවේද, එවන් අදහස් ලබාගැනීමේ ක්‍රියාවලියකට වඩා හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ ක්‍රමවේදයක් බව පෙනේ.

## මානව හිමිකම් සම්මතයන් දේශීය වශයෙන් බලාත්මක කිරීම

ජලය සඳහා වන අයිතිය උල්ලංඝනය වූ විට ඒ පිළිබඳව අධිකරණය ඉදිරියට යා හැකි පරිද්දෙන් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල අයිතිවාසිකමක් ලෙස දක්වා ඇති දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව[18] මෙන් නොව, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව[19] මඟින් සමාජ, සංස්කෘතික හා ආර්ථික අයිතිවාසිකම් බලාත්මක කළහැකි අයිතිවාසිකම් ලෙස හඳුනාගනු නොලබයි. එමනිසා, පැනනඟින අවශ්‍යතාවයන් අනුව, පවතින අධිකරණමය ක්‍රියාමාර්ගයන්හි පිහිට ලබාගැනීමට හැකි වඩාත් නිර්මාණශීලී ක්‍රියාපටිපාටි පිළිබඳව සොයා බලන්නටත්, අධිකරණයට වඩාත්ම ගැළපෙනු ඇතැයි සිතියහැකි නව මංපෙත් ගවේෂණය කරන්නටත් මානව හිමිකම් ක්‍රියාකරුවන්ට නිතරම සිදුවේ.



**Image : Nestle**

එවන් එක් එළඹුමක් වන්නේ පවතින මූලික අයිතිවාසිකම් රාමුවටම සමාජ-ආර්ථික අයිතිවාසිකම්ද ඒකාබද්ධ කිරීමයි. ජලය, ජීවිතය සඳහා අවශ්‍ය කරන අවම මූලික අවශ්‍යතාවයන්ගෙන් එකක් වනබව පිළිගනිමින් ඉන්දියාව එක් අවස්ථාවකදී තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සමාජ, සංස්කෘතික සහ ආර්ථික අයිතිවාසිකම් අන්තර්ගත නොවීමේ අඩුපාඩුව මගහරවාගන්නට මෙම තර්කය භාවිතා කර තිබේ.[20] ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙන් නොව, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ජීවිතයට ඇති අයිතිවාසිකම පිළිගනු නොලබයි. කෙසේනමුත්, නීතිවිරෝධී ලෙස රඳවා තබාගැනීම පිළිබඳව වූ නඩුවකදී, ජීවිතය අහිමි කර නොගැනීම සඳහා වන අයිතිය යන්නෙහි අනිවාර්ය ගම්‍යාර්ථය මඟින් ජීවිතය සඳහා වන අයිතිය පිළිගනු ලබන බවට අධිකරණය විසින් අර්ථ නිරූපණය කර තිබේ.[21] තවද, ඇළුමිනියම් කර්මාන්තශාලාවක පාරිසරික බලපෑම පිළිබඳව වූ නඩුවක් වන *සිංගලංකා ස්ටෑන්ඩර්ඩ් කෙමිකල්ස් එදිරිව තලංගම* නම් නඩුකරයේදී මහජන කරදරය සංකල්පය පිළිබඳ අදහස් දක්වමින් අභියාචනාධිකරණය විසින් මෙම ඍණාත්මක බැඳීම ධනාත්මක අයිතිවාසිකමක් බවට වැඩිදුරටත් පත්කරන ලදී. එමනිසා, ජීවිතය සඳහා වන අයිතියේ විෂය සීමාවට යෝග්‍ය පරිසරයක් සඳහා වන අයිතිය ද ඇතුළත් වන බව පිළිගන්නා ලදී. මෙසේ සිදුකර ඇත්තේ අයිතිවාසිකම් වඩාත් පුළුල්ව අර්ථ නිරූපණය කළයුතු වන බවට සහ මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම යන අරමුණ යටතේ එකී අයිතිවාසිකම් සාධනීය අන්දමින් ආරක්ෂා කිරීම සඳහා සාධාරණව අවශ්‍ය කරන සියල්ල අධිකරණයට පවරා ඇතැයි සැලකියයුතු බවටත් වන තර්කය යටතේ වේ. එමනිසා, යෝග්‍ය පරිසරයක එක් අංගයක් වශයෙන් ජලය සඳහා වන අයිතිවාසිකම ද පිළිගැනීම සඳහා එකී මූලධර්මයම විස්තීර්ණ කිරීමට ශ්‍රී ලංකා අධිකරණය විවෘත වන බවක් පෙනී යයි.

අයිතිවාසිකම් කෙරෙහි අහිතකර බලපෑම් එල්ල කරමින් සංස්ථාපිත ආයතන විසින් සිදුකරන ක්‍රියාකාරකම් සීමාකිරීම සම්බන්ධයෙන් ගත් කල, රජය විසින් නීත්‍යානුකූලව බලාත්මක කර ඇති විවිධ නියාමන යාන්ත්‍රණයන්ට අමතරව සංස්ථාපිත ආයතනවල අයිතිවාසිකම් මඟින් මහජනතාවගේ සෞඛ්‍යයට යම් බාධාවක් ඇතිකරන ඕනෑම අවස්ථාවකදී එකී අයිතිවාසිකම් සීමා කෙරෙන බව ශ්‍රී ලංකාවේ අධිකරණ මඟින් පෙන්වාදී තිබේ.

සිගරට් පැකැට්ටු මත රූපමය අවවාද මුද්‍රණය කළයුතු බව නියම කරන නියෝගයක් ලංකා දුම්කොල සංස්ථාව විසින් අභියෝගයට ලක් කළ අවස්ථාවේදී, සේවා නියුක්තිය සඳහා සහ අදහස් ප්‍රකාශ කිරීම සඳහා එකී සමාගමට ඇති අයිතිවාසිකම මඟින් ශ්‍රී ලංකාව විසින් අනුගමනය කිරීමට එකඟවී ඇති ජාත්‍යන්තර බැඳීම් මඟින් පිළිගෙන තිබෙන අයිතිවාසිකමක් වන මහජනතාවගේ සෞඛ්‍යයට ඇති අයිතිවාසිකම යටපත් කිරීමට නොහැකි බව සඳහන් කළ අභියාචනාධිකරණය, එම නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කරවන ලෙස සමාගම විසින් සිදුකළ ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.[22]

ජාත්‍යන්තර මට්ටමින් පිළිගෙන ඇති සෞඛ්‍යය සඳහා වන අයිතිවාසිකම දේශීය නීතියේ පාලනයටද අදාළ වනබව සඳහන් කිරීම හේතුවෙන්ම පමණක් නොව, සංස්ථාපිත සමාගම්වල අයිතිවාසිකම් මහජනතාවගේ මූලික යහපතට යටත් වනබව එහිදී පිළිගෙන ඇති හෙයින් ද මෙම නඩු තීන්දුව වැදගත් වේ.

මානුෂීය කෝණයකින් බලන කළ, චුන්නාකම් ජල අර්බුදයෙන් බලපෑමට ලක්වී සිටින පුද්ගලයින්ට මුහුණ පාන්නට සිදුව ඇති

---

[18] 27 වන ව්‍යවස්ථාව, *දකුණු අප්‍රිකානු ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව*, 1996 දෙසැම්බර් 10; *මසිබුකෝ සහ වෙනත් අය එදිරිව ජොහැන්නස්බර්ග් නගරය හා වෙනත් අය* (CCT 39/09) [2009] ZACC 28; 2010 (3) BCLR 239 (CC) ; 2010 (4) SA 1 (CC) (8 October 2009).

[19] ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 1978

[20] *එයාර් ඉන්ඩියා සංස්ථාපිත සමාගම එදිරිව එක්සත් වෘත්තීය සංගමය* AIR 1997 SC 645

[21] *ශ්‍රියානි සිල්වා එදිරිව ඉද්දමල්ගොඩ,* S.C. (FR) No. 471/2000, S.C.M 8/8/2003

[22] *ලංකා දුම්කොළ සංස්ථාව එදිරිව සෞඛ්‍ය අමාත්‍යවරයා,* C.A. 336/2012, අභියාචනාධිකරණය (2014)

තත්ත්වය තව තවත් ප්‍රමාද නොවී අවසානයක් වේවායි ප්‍රාර්ථනා කිරීමට යමෙකුට හැකිය. කෙසේනමුත්, මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයින්ගේ කෝණයෙන් බලන කළ, මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඇති නීති ව්‍යාවහාරය තුළ ජලය සඳහා වන අයිතිවාසිකම සුරක්ෂිත කිරීම සඳහා අධිකරණයට චුවමනා කරන තල්ලුව බොහෝ දෙනෙකුට අත්ව ඇති මෙම ඉරණම තුළින් ඇතැම්විට ලැබෙනු ඇතැයි යන බලාපොරොත්තුවක් ද පවතියි.

විශාඛා විජේනායක[23]

## දෙමළ ජනතාවට මේ ලැබෙන්නේ බලාපොරොත්තුවේ ඡායාමාත්‍රයක්ද?




**Image : Vikalpa/ CPA**

බලයේ සිටින සභාග ආණ්ඩුව බලයට පත්වී දැනට මාස 2කට ආසන්න කාලයක් ගතවී තිබේ. කෙසේ නමුත්, උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන ද්‍රවිඩ ජනතාවගේ මූලික ගැටළුවලින් කිසිවක් සඳහා පිළිතුරු ලබාදීම සඳහා රජය විසින් කටයුතු කර නොමැත. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ජීවත්වන දෙමළ ජනතාව කොන්දේසි විරහිතව නව රජයට තම ඡන්දය ලබාදුන්නේ ඔවුන්ගේ අයිතිවාසිකම් යථාර්ථයක් බවට පත්කරනු ඇති බවත්, ප්‍රතිසංධානය ළඟා කර ගැනීම සඳහා අව්‍යාජ උත්සාහයන් දරනු ඇති බවටත් වූ අපේක්ෂාවෙන් වේ. පහතින් දක්වා ඇති ඔවුන්ගේ ගැටළු ආමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් පවතින ප්‍රමාදය පිළිබඳව සිවිල් සමාජය, ආගමික නායකයින් සහ දෙමළ දේශපාලන නායකයින් ඇතුළුව ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන පාර්ශ්ව ගණනාවක් විසින් තම නොසතුට පළකර තිබේ.

1. *ඉඩම් ගැටළු -*

උතුරේ ඇති ඉඩම් නැවත සිවිල් වැසියන්ට නිදහස් කරදීම සඳහා වැඩසටහනක් ආරම්භ කිරීම පිණිස ජනාධිපතිවරයාගේ නියමය අනුව කමිටුවක් පත්කරනු ඇති බවට රජය විසින් සඳහන් කර තිබුණත්, මේ සඳහා කිසිදු සැබෑ පියවරක් මේ වනතුරු ගෙන නොමැත. ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින් සඳහන් කර ඇත්තේ උතුරු හා නැගෙනහිර පළාත්වල ඇති ඉඩම් සාධාරණ සහ යුක්තිසහගත අන්දමින් නැවතත් සිවිල් වැසියන් වෙත නිදහස් කෙරෙන බවත් සිවිල් වැසියන්ට උවමනා කරන ඉඩම් නිදහස් කරදීම සඳහා යුධහමුදා කඳවුරු ඉවත් කරගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනඟින බවත්ය[24]. අධි ආරක්ෂිත කලාප වලින් ඉඩම් නිදහස් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබුණු බවක් රජය විසින් සනාථ කර තිබුණද, ඊට අයත් වන්නේ අදාළ භූමියෙන් ඉතා සුළු කොටසක් වන බවත්, තමන්ගේ සාම්ප්‍රදායික ගම්වල යළි පදිංචිවීමට තමන් කැමති බවත් සඳහන් කරමින් බොහෝ පදිංචිකරුවන් විසින් පැමිණිලි කරනු ලැබී ඇත.

2. *දේශපාලන සිරකරුවන් සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම -*

67 වන නිදහස් සැමරුම් දිනයේදී ජනාධිපති සමාව ලබාදීම යටතේ නිදහස් කරන ලද සිරකරුවන් 554 දෙනා අතරට එකඳු දෙමළ දේශපාලන සිරකරුවෙක් හෝ ඇතුළත් නොවූ අතර, මෙය ප්‍රතිසංධානය සම්බන්ධයෙන් සිරිසේන මහතා ලබාදී තිබූ පොරොන්දු කෙරෙහි තම බලාපොරොත්තු තබාගෙන සිටි දෙමළ ප්‍රජාවේ බලාපොරොත්තු සැලකිය යුතු අන්දමින් සුන් කිරීමට හේතු විය. පොදු සමාවක් සමඟින් දේශපාලන සිරුකරුවන් නිදහස් කිරීම තුළින් ප්‍රතිසංධානය සඳහා මගපෑදීමට ඉඩ තිබිණි. රහස් රැඳවුම් කඳවුරුවල රඳවාගෙන සිටින එල්ටීටීඊ සාමාජිකයින් සංඛ්‍යාව හෙළිදරව් කිරීමත්, සිවිල් සමාජය සහ ජාත්‍යන්තර පරීක්ෂකයින්ට එම පුනරුත්ථාපන කඳවුරු කරා යාම සඳහා ඉඩ ලබාදීම සහ නීතීඥවරුන්ට සීමා නොකළ ප්‍රවේශ හැකියාවක් ලබාදීම තුළින් ප්‍රතිසංධානය සඳහා රජයේ ඇති කැමැත්ත සහ කැපවීම පෙන්නුම් කෙරෙනු ඇත. යාපනයේ කතෝලික දියෝකීසියේ (වසමේ) යුක්තිය සහ සාමය සඳහා වන කොමිෂන් සභාව විසින් සියළුම දෙමළ දේශපාලන සිරකරුවන් නිදහස් කරන ලෙසත්, අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් යළි තම මුල් බිම්වල පදිංචි කරවන ලෙසත් ජනාධිපතිතුමාගෙන් ඉල්ලා තිබේ[25].

3. *බලහත්කාරයෙන් සිදුකරන අතුරුදන්කිරීම් -*

අතුරුදන් වූ පුද්ගලයින් සම්බන්ධයෙන් වන පැමිණිලි පිළිබඳව සොයා බැලීම සඳහා පත්කරන ලද, ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂීය නීතිද ඇතුළුව යුද්ධ කාලයේදී සිදුවූ උල්ලංඝනයන් ආමන්ත්‍රණය කිරීම සඳහා වන එකම යාන්ත්‍රණය වන ජනාධිපති කොමිෂන් සභාව 20,000 කට අධික පැමිණිලි සංඛ්‍යාවක් මේ වනවිට භාරගෙන තිබේ. කෙසේ නමුත් ඒ සම්බන්ධයෙන් වර්තමානයේදී විමර්ශන කටයුතු කෙරීගෙන යන බවක් පෙනෙන්නට නොමැත. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) විසින් ඉදිරිපත්කර ඇති නවතම විග්‍රහය[26] තුළින් මෙම කොමිෂන් සභාවේ විශ්වාසනීයත්වය බිඳ හෙලනු ලබන මූලික ගැටළු සහ ප්‍රවණතා මනාව හසුකරගෙන තිබේ. පශ්චාත් යුධ පසුබිමක ඇති දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමට දේශීය ක්‍රියාවලියකට ඇති නොහැකියාව මෙම ක්‍රියා පටිපාටිය තුළ ඇති අඩුපාඩු වලින් තවත් තහවුරු වන බවත්, ජාත්‍යන්තර විමර්ශනයක් සඳහා වන අවශ්‍යතාවය තවත් ශක්තිමත් වන බවත් එහි තවදුරටත් සඳහන් කර තිබේ.

---

[23] නීතිය පිළිබඳ පශ්චාත් උපාධි අපේක්ෂිකා (මිචිගන් විශ්වවිද්‍යාලය); නීතීඥ; නීතිවේදී උපාධිධාරිනී (කොළඹ විශ්වවිද්‍යාලය)

[24] http://www.defence.lk/new.asp?fname=Govt_to_appoint_committee_to_inquire_land_issue_in_North_20150209_04

[25] http://www.ceylontoday.lk/51-83376-news-detail-jaffna-diocese-calls-for-the-release-of-tamil-political-prisoners.html

[26] The Presidential Commission to investigate into complaints regarding missing persons, Trends, practices and implications, A critique, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2014 දෙසැම්බර්

4. *මිලිටරීකරණය -*

යුධහමුදාව උතුරෙන් ඉවත් කර නොගන්නා බව ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයා විසින් විවිධ අවස්ථාවන්හිදී ප්‍රකාශ කර තිබේ. "යුධ භටයින් සංඛ්‍යාව අඩු නොකරන බවත්, දැනට පවතින හමුදා කඳවුරු සංඛ්‍යාව ඉවත් කිරීමකින් තොරව ඒ අන්දමින්ම පවත්වාගෙන යනු ඇති බවත්" යාපනයට සිදුකළ ඔහුගේ සංචාරයේදී අමාත්‍යවරයා විසින් සඳහන් කර තිබේ.[27] පෙනෙන අන්දමට අස්ගිරි පාර්ශ්වයේ මහානායක ස්වාමීන් වහන්සේද අමාත්‍යවරයාට සඳහන් කර ඇත්තේ ආරක්ෂක හමුදාවන් එහි සිටීම හේතුවෙන් උතුරේ ජීවත්වන ජනතාව සාමයෙන් ජීවත්වන බවත්, එනිසා දිවයිනේ කිසිම ප්‍රදේශයකින් ආරක්ෂක හමුදා ඉවත්කර ගැනීම එතරම් සුදුසු නොවන බවත්ය.[28] එවකට ජනාධිපති ධූර අපේක්ෂක වශයෙන් සිටි සිරිසේන මහතාද තම මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේදී පැහැදිලිව පෙන්නුම් කළේ උතුරු ප්‍රදේශයෙන් හමුදාව ඉවත් නොකරන බවයි. උතුරේ සහ නැගෙනහිර ජීවත්වන පුද්ගලයින්ගේ ජීවිතවල සියලුම අංශ හමුදාව අතින් ඉතා ඉහළ මට්ටමකට පාලනය කෙරෙන හෙයින් සිවිල් කටයුතුවල හමුදාව නිරූපණය කරන ප්‍රමුඛ භූමිකාව මඟින් සාමය සහ ප්‍රතිසංධානය කෙරෙහි තර්ජනයක් එල්ලවී තිබේ.

5. *වාර්ගික ගැටුමට දේශපාලන විසඳුමක් සොයා ගැනීම සම්බන්ධයෙන් වන ව්‍යාකූලත්වය -*

වාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් යෝජනා කෙරී නොමැති අතර, වාර්ගික ප්‍රශ්නය සඳහා ඉදිරිපත් කෙරෙන යම් දේශපාලන විසඳුමක් වෙතොත් ඒ පිළිබඳව සිරිසේන රජය මඟින් දිගින් දිගටම පෙන්නුම් කරන්නේ නොපැහැදිලි හා ව්‍යාකූල ආකල්පයකි. මේ සම්බන්ධයෙන් විය හැකි විසඳුම් පිළිබඳව ඔවුන්ගේ දේශපාලන ප්‍රතිපත්ති ප්‍රකාශයෙහි පවා සඳහන්ව තිබුණේ ව්‍යාකූල අන්දමින් වන අතර, රජය දිගින් දිගටම ඒ ආකාරයෙන්ම සිටින බවක් පෙන්නුම් කරයි. සිරිසේන මහතා රට දෙකඩ කිරීමට යන බව පවසමින් රාජපක්ෂ දේශපාලන ව්‍යාපාරය විසින් තමන්ට ලබාගැනීමට උත්සාහ කළ බහුතර සිංහල ඡන්ද ලබාගැනීමේ අවශ්‍යතාවය මත මෙය මේ අන්දමින් සිදුවන බවට විචාරකයෝ තර්ක කරති. 2015 අප්‍රේල් මාසයේදී මහ මැතිවරණයක් නිවේදනය කරන්නට නියමිතව තිබියදී, නැවතත් වත්මන් පරිපාලනය විසින් ගනුලබන තීරණ වලට බලපාන ප්‍රධාන සාධකයක්ව ඇත්තේ සිංහල බහුතරයයි.

6. *උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් වාර්තාව ක්‍රියාත්මක කිරීම -*

යුද්ධයේ අවසන් අදියරයන්හිදී සිදුවූවා යැයි චෝදනා කරන යුධ අපරාධ සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වීමටත් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ නිර්දේශයන්ට අනුකූලව ක්‍රියාකිරීමටත් (විවිධ ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙයද අඩුපාඩු සහිත යාන්ත්‍රණයක් ලෙස සලකනු ලැබේ) කටයුතු කරන බවට සිරිසේන මහතා විසින් පොරොන්දු වුවද උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඔහු විසින් කිසිදු සැබෑ පියවරක් ගෙන නොමැත.

7. *අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් යළි පදිංචි කිරීම -*

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් ඔවුන්ගේ මුල් බිම්වල යළි පදිංචි කිරීමටත්, එකී යළි පදිංචි වූ ප්‍රදේශ වලට[29] යටිතල පහසුකම් ලබාදීමටත් අවශ්‍ය පියවර ගන්නා බවට වත්මන් රජය පොරොන්දු වී තිබුණත් මෙම ගැටළුව ප්‍රායෝගිකව විසඳීම සඳහා සැබෑ ක්‍රියාමාර්ග කිසිවක් ගෙන නොමැත.

වාර්ගික ගැටළුවට දේශපාලන විසඳුමක් ලබාගැනීම සඳහා කටයුතු කරන අතරේම මෙකී හදිසි හා බරපතල ගැටළුද ආමන්ත්‍රණය කිරීමට කටයුතු කිරීම තුළින් දෙමළ ජාතික සංධානය (TNA) සහ නව රජය අතර යහපත් සහයෝගීතාවයක් ඇති කරගැනීම සඳහා සුදුසු ආරම්භයක් ගෙන දෙනු ඇත. එමෙන්ම දෙමළ සහ සිංහල ජාතීන් අතර ඇති සම්බන්ධතාවය වඩාත් ශක්තිමත් කිරීමට එය හේතුවනු ඇත. එසේ හෙයින්, වෙනසක් ඇති කිරීම සඳහා සහ දශක ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලාංකිකයන්ට අහිමි කරතිබූ දීර්ඝ කාලීන සාමය උදාකරදීම සඳහා ඔවුන් සැබැවින්ම කැපවී කටයුතු කරන්නේ නම් නව ජනාධිපතිවරයා සහ අගමැතිවරයා විසින් දෙමළ ජාතිකයින්ගේ අපේක්ෂාවන් සැලකිල්ලට ගෙන කටයුතු කිරීම ඉතාම වැදගත් වේ.

අයින්කරන් කුගදාසන් [30]

## පාරිසරික වශයෙන් අභියෝගයට ලක්වූ කොළඹ වරාය ව්‍යාපෘතිය



**Image : Dominic Sansoni/ World Bank**

ඩොලර් බිලියන 1.4 ක වටිනාකමක් ඇති බවට ඇගයුම් කර ඇති කොළඹ වරාය ව්‍යාපෘතිය දිගින් දිගටම වංචා පිළිබඳව චෝදනාව සමගින් ඈඳුනු සහ හු දේශපාලනික වශයෙන් කුතුහලයට පාත්‍ර වූ දේශපාලන වෘත්තාන්තයක් බවට පත්වී තිබේ. මෑතකදී, ව්‍යාපෘතියේ පාරිසරික බලපෑම් විශ්ලේෂණය (EIA) සම්බන්ධ කරගනිමින් විරුද්ධකරුවන් විසින් ඔවුන්ගේ විරෝධතා යළි ආරම්භ කර තිබේ. අවාසනාවකට මෙන් පාරිසරික බලපෑම් ඇගයුම දේශපාලනීකරණය වීමේ ප්‍රතිඵලයක් වශයෙන් සංවර්ධනය සහ පාරිසරික තිරසාරත්වය යන කාරණා දෙක වෙන් කරන්නා වූ ව්‍යාජ දෙබෙදුමක් පවතී. පාරිසරික බලපෑම්

---

[27] http://www.dailymirror.lk/63055/no-troops-reduction-in-north-minister-ruwan#sthash.FVmMuMJE.dpuf

[28] http://www.lotuscomm.net/news/news-updates/1135-sri-lanka-buddhist-prelate-asks-not-to-withdraw-military-from-any-part-of-the-country

[29] http://www.dailynews.lk/?q=local/resettlement-remaining-idps-be-expedited-minister

[30] නීතිඥ

විශ්ලේෂණ සම්බන්ධයෙන්ම පවතින විවිධ වැරදි අවබෝධයන්ද එයින් මනාව පැහැදිලි වේ.

## අපට පාරිසරික බලපෑම් විශ්ලේෂණ අවශ්‍ය කරන්නේ ඇයි?

සංවර්ධනය සහ පරිසරය මත එයින් වන බලපෑම පිළිබඳ පවතින සාම්ප්‍රදායික අවබෝධය අනුව නිගමනය කරනු ලබන්නේ ආදායම වැඩි වීමත් සමඟ පරිසර විනාශය සම්බන්ධයෙන් රොබෝවකුගේ වැනි ප්‍රතිචාරයක් දක්වෙන බවයි. මෙම සම්බන්ධතාවය අවබෝධ කරගනු ලබන එක් අංශයක් වන්නේ සම්පත් වෙන් කිරීමයි. උදාහරණ වශයෙන් පෝල් කුස්නෙට්ස් විසින් තර්ක කරන පරිදි සංවර්ධනයේ මුල් අවදීන්හීදී පවතින අකාර්යක්ෂමතාවය සහ නාස්තිය මඟින් ප්‍රමාණය ඉක්මවූ පරිසර දූෂණයකට මඟපාදන හෙයින් එම මුල් අදියරයන්හිදී පරිසර විනාශය වැඩි වේ. මේ සම්බන්ධයෙන් වන සමාජ විද්‍යාත්මක අවබෝධයද සැලකිල්ලට ගැනීම වටී. උදාහරණ වශයෙන් රොබට් නැෂ්ගේ තර්කයට අනුව සංවර්ධනය වෙමින් පවතින සමාජ, තම උපයෝජනය සඳහාම පවතින මනාව පරිණත වූ සම්පතක් ලෙස පරිසරය දකින අතර, මෙය සංවර්ධනයේ මුල් අදියරයන්හිදී බරපතල පාරිසරික හානි සඳහා මඟපාදයි. මෙම තර්ක දෙකටම අනුව පෙනී යන්නේ කර්මාන්ත වඩාත් කාර්යක්ෂමවීම හේතුවෙන් හෝ පරිසරය සම්බන්ධයෙන් පවතින ආකල්ප වඩාත් යහපත් ලෙස වෙනස් වීම හේතුවෙන්, සංවර්ධනය වැඩිවීමත් සමගින් පරිසර දූෂණය අඩු වීමට මඟ සැලසෙන බවයි.

කෙසේ නමුත්, පරිසරය සහ සංවර්ධනය සම්බන්ධයෙන් වන අපගේ එළඹුමට මඟපෙන්වීම සඳහා මේ පිළිබඳව ඇති සාම්ප්‍රදායික අවබෝධය තවදුරටත් ප්‍රමාණවත් නොවේ. අපගේ ස්වාභාවික වාසභූමි අවදානමට ලක්විය හැකි බවත්, ඒවා සීමිත බවත් අපගේ සමාජය විසින් මදින් මද අවබෝධ කරගැනීම ආරම්භ වී තිබේ. සීමා නොකරන ලද වර්ධනය නම් වූ විකල්පය තවදුරටත් ශ්‍රී ලංකාව වැනි රටවල් ඉදිරියේ නොමැත. මෙම ''සම්මත'' සංවර්ධන ආකෘතියෙන් බැහැරව ඇති විකල්ප ආකෘතිය වන්නේ, අනාගත පරම්පරාවට ඔවුන්ගේ ජීවිත වඩාත් වැඩිදියුණු කරගැනීමට ඇති අවස්ථාවන් අහිමි නොකරන අන්දමට පවතින සම්පත් භාවිතා කරමින් සමාජය විසින් තම ජීවන තත්ත්වය වැඩිදියුණු කරගැනීමට උත්සාහ කිරීම යෝජනා කෙරෙන තිරසාර සංවර්ධනයයි. පාරිසරික බලපෑම් විශ්ලේෂණය මෙතරම් වැදගත් භූමිකාවක් නිරූපණය කරන්නේ මෙවන් පසුබිමක් යටතේයි.

## පාරිසරික බලපෑම් විශ්ලේෂණයක් මගින් සිදුකරන්නේ කුමක්ද?

පාරිසරික ගිවිසුම් සහ වෙළඳ ගිවිසුම් වල අත්‍යාවශ්‍ය අංගයක් බවට පත්වී ඇති පාරිසරික බලපෑම් විශ්ලේෂණ, මේ වනවිට ජාත්‍යන්තර නීතියේ සම්ප්‍රදායක් බවට පත්ව තිබේ. පරිසරය සහ සංවර්ධනය සම්බන්ධයෙන් වන රියෝ ප්‍රකාශනයේ 17 වැනි මූලධර්මය, එස්පූ (Espoo) ප්‍රඥප්තිය සහ මායිම් වලින් ඔබ්බට යන හානි පිළිබඳව වන අයි.එල්.සී. (ILC) ව්‍යවස්ථා කෙටුම්පතේ 7 වැනි ව්‍යවස්ථාව, සනීපාරක්ෂක සහ ශාක සනීපාරක්ෂක ගිවිසුමේ පස්වන වගන්තිය යන ඒවා පාරිසරික බලපෑම් විශ්ලේෂණයක මූලික මූලධර්ම සැකෙවින් දක්වා ඇති අවස්ථාවන්ට උදාහරණ කිහිපයක් වේ.

පාරිසරික බලපෑම් විශ්ලේෂණයක අරමුණ අවබෝධ කරගත හැකි එක් ක්‍රමයක් වන්නේ එය සිගරට් පැකට්ටුවක දක්වා ඇති අවවාදාත්මක දැනුම්දීමට සමාන කිරීමයි. පැකට්ටුවේ දක්වා ඇති අවවාද මඟින් සිදුකරන්නේ එය මිලදී ගත්පසු තමන්ට විඳින්නට වන ප්‍රතිවිපාක පිළිබඳව පාරිභෝගිකයා දැනුවත් කිරීම පමණක් වන අතර, තමන් කැමති නම් එය මිලදී ගැනීමේ නිදහස ඔවුන් සතුවේ. ඒ හා සමානවම, පාරිසරික බලපෑම් විශ්ලේෂණයක් සිදුකරනු ලබන්නේ යෝජිත ක්‍රියාකාරකමක් සඳහා අනුමැතිය දීම සුදුසුද යන්න සහ ඒ සම්බන්ධයෙන් පැනවිය යුතු පාලනයන් සහ විධිවිධාන කවරේදැයි යන්න තීරණය කිරීමේදී එකී ක්‍රියාකාරකමෙන් සිදුවීමට ඉඩ ඇති පාරිසරික බලපෑම් පිළිබඳව තීරණ ගන්නන් සහ මහජනතාව දැනුවත් කිරීම වේ.

කෙසේනමුත්, පාරිසරික බලපෑම් විශ්ලේෂණ යනු යම් ව්‍යාපෘතියක් ඉදිරියට කරගෙන යා යුතුද නැතහොත් එය කුමන අන්දමෙන් නියාමනය කළ යුතුද යන්න තීරණය කිරීම සඳහා භාවිතා කළහැකි මෙවලම් නොවේ. තවද 'සතුටුදායක' වන බවට තීරණය කරන ලද පාරිසරික බලපෑම් විශ්ලේෂණයක් තිබීම යන්න පමණක් පාරිසරික හානි පිළිබඳ අවදානමක් නොමැති බවට කෙරෙන සහතිකයක් නොවන බව පැහැදිලිය. ඒ වෙනුවට එයින් සිදුවිය යුතු වන්නේ ව්‍යාපෘතියෙන් සිදුවිය හැකි බලපෑම පිළිබඳව අවශ්‍ය කරන තොරතුරු ලබාදීම සහ නිසි ක්‍රියාවලීන් අනුගමනය කිරීමයි. මෙහිදී 'නිසි' පාරිසරික ඇගයුමකට ඇතුළත්වන අංග කවරේද යන්න පිළිබඳව ජාත්‍යන්තර ගිවිසුම් පවා පැහැදිලි අදහසක් ලබාදී නොමැති බවද පිළිගත යුතුවේ.

## ශ්‍රී ලංකාවේ සිදුකෙරෙන පාරිසරික බලපෑම් විශ්ලේෂණ

ශ්‍රී ලංකාවේ පාරිසරික බලපෑම් විශ්ලේෂණ සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශවලින් බහුතරයක් දක්වා ඇත්තේ 1988 අංක 56 දරණ ජාතික පරිසර (සංශෝධන) පනතෙහි වන අතර "පරිසරය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුකිරීමට" ඉඩ ඇති මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සඳහා පාරිසරික බලපෑම් විශ්ලේෂණ සිදුකළ යුතු බවට එහි නියම කර තිබේ. මෙහිදී සිදුකරන විශ්ලේෂණයේ බරපතලභාවය තීරණය වන්නේ අදාල ක්‍රියාවේ බරපතලභාවය මතයි. එතරම් වැදගත්කමක් නොමැති ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන්නේ මූලික පාරිසරික විභාගයක් (IEE) පමණක් වන අතර, එය වඩාත් කෙටි සහ සරල වූ ක්‍රියාදාමයක් වේ. වඩාත් සැලකිය යුතු ව්‍යාපෘති සඳහා වඩාත් පුළුල් ලෙස සිදුකෙරෙන පාරිසරික බලපෑම් විශ්ලේෂණ අවශ්‍ය වේ. එසේම පාරිසරික බලපෑම් විශ්ලේෂණයක් මහජන අදහස් ලබාගැනීම සඳහා වැඩකරන දින 30 ක් මුළුල්ලේ විවෘතව තැබිය යුතුවේ (IEE මෙයින් නිදහස් වේ).

ශ්‍රී ලංකාවේ සිදුකෙරෙන පාරිසරික බලපෑම් විශ්ලේෂණ දේශපාලනීකරණය වීම සමඟින් එහි අගය ඉතා බරපතල ලෙස වැරදි වටහාගැනීමකට ලක්වී තිබේ. තීරණ ගන්නා කණ්ඩායම් සහ මහජනතාවට තීරණයකට එළඹීම සඳහා සහය ලබාදීම පිණිස නිර්මාණය කරන ලද තොරතුරු මූලාශ්‍රයක් වශයෙන් පාරිසරික බලපෑම් විශ්ලේෂණය අවබෝධ කරගැනීමෙන් බැහැරට ගොස් ව්‍යාපෘතියක් සඳහා අනුමැතිය ලබා ගැනීම තීරණය කරන්නාවූ, අනුමැතිය සඳහා හරි ලකුණක් ලබා ගත යුතු නිලධාරීවාදී පිරික්සුම් කොටුවක් ලෙසින් එය වර්තමානයේදී බොහෝ දෙනා විසින් අවබෝධ කරගෙන තිබේ. මෙමඟින් පාරිසරික බලපෑම් විශ්ලේෂණයේ අගය පහත හෙලනු ලබන අතර, මහජනතාව තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් තවදුරටත් දුරස්කරනු ලැබේ.

**පාරිසරික බලපෑම් විශ්ලේෂණ වඩාත් හොඳින් ක්‍රියාත්මක කරන්නේ කෙසේද?**

සර්ව සම්පූර්ණ නොවුනත්, පාරිසරික බලපෑම් විශ්ලේෂණ වැඩිදියුණු කිරීම සඳහා ප්‍රායෝගිකව අනුගමනය කළ හැකි ක්‍රමවේදයක් වන්නේ පුළුල්ව මහජන අදහස් විමසීමයි. ලොව අනිකුත් රටවල් වල මේ සම්බන්ධයෙන් ඇති කරගෙන තිබෙන විවිධ පරිචයන් මාර්ගෝපදේශයට ගැනීමට ශ්‍රී ලංකාවට හැකිය. පරමාදර්ශී වශයෙන් නම් එසේ විශේෂිතවම බලපෑමට ලක්වන ප්‍රදේශයේ පුළුල් මහජන අදහස් විමසුමක් ආරම්භ කිරීමේ සහ ඒ සඳහා අරමුදල් දැරීමේ වගකීම ව්‍යාපෘතියේ යෝජකයා, රජයේ නිසි බලධරයා හෝ වෙනත් ආයතනයක් විසින් භාරගත යුතුය.

මහජනතාව අතර තොරතුරු බෙදාදීමට භාවිතා කළ හැකි ක්‍රම රාශියකි. පාරිසරික බලපෑම් විශ්ලේෂණය සම්බන්ධයෙන් තමන්ගේ ප්‍රතිචාර ලබාදෙන ලෙස ගුවන්විදුලිය, රූපවාහිනය සහ පුවත්පත් හරහා මහජනතාවට දැනුම්දීමට බලධාරීන්ට හැකිය. ප්‍රසිද්ධ නඩු විභාගයක් පැවැත්වීම හෝ පාරිසරික බලපෑම් විශ්ලේෂණය පිළිබඳ රැස්වීම් පැවැත්වීම හෝ යෝජිත ක්‍රියාකාරකම සිදුකෙරන භූමිය හා ඒ අවට මහජනතාවට සම්බන්ධ විය හැකි ස්ථානයක් ඇති කිරීම යනාදී ක්‍රම අනෙකුත් වඩා පුළුල් ක්‍රමවේද අතරට ඇතුළත් වේ. පාරිසරික බලපෑම් විශ්ලේෂණ ප්‍රකාශනය කිරීමටත්, ඒ සම්බන්ධයෙන් අදහස් හා ප්‍රතිපෝෂණ ලබාගැනීමටත් වෙන් කෙරුණු විද්‍යුත් ලිපින සහ වෙබ් අඩවි භාවිතයද ප්‍රයෝජනවත් වනු ඇත. භාවිතා කරනු ලබන ක්‍රමය කුමක් වූවද මෙම ක්‍රම හරහා ලබාගනු ලබන අන්තර්ගතය සඳහා අවදානය යොමු කිරීම වැදගත් වේ.

මහජනතාවගෙන් අදහස් විමසුමක් සිදුකරන්නේ නම් එහිදී ව්‍යාපෘතිය සහ එහි පාරිසරික බලපෑම විස්තර කිරීම අවශ්‍ය වේ. එනම්, ව්‍යාපෘතිය සහ එහි අරමුණ පිළිබඳව වන මූලික අවබෝධයකට අමතරව එයින් විය හැකි පාරිසරික බලපෑම, එම හානි අවමකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග, මේ සම්බන්ධයෙන් ඇති දැනුමේ පවතින අඩුපාඩු සහ ව්‍යාපෘතිය අධීක්ෂණය සහ කළමනාකරණය සඳහා ඇති කර තිබෙන යාන්ත්‍රණ යනාදිය ද පාරිසර බලපෑම් විශ්ලේෂණය හරහා විස්තර කළයුතු වේ. පාරිසරික බලපෑම් විශ්ලේෂණ භාවිතා කළයුතු වන්නේ මහජනතාව දැනුවත් කිරීමටත්, ඔවුන්ට අවබෝධයක් ලබාදීමටත් විනා ඔවුන්ව වඩාත් පැටළිලි සහගත තත්ත්වයකට පත්කිරීමටත්, ඔවුන් අතර ප්‍රතිවිරුද්ධ මත ඇති කරවීමටත් නොවේ.

පාරිසරික බලපෑම් විශ්ලේෂණය තිරසාර සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වන නමුත් එය එසේ වන්නේ ඇයිද යන්න සහ ඒවා ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න පිළිබඳව මනා අවබෝධයක් ලබාගැනීම වැදගත් වේ. පාරිසරික බලපෑම් විශ්ලේෂණ, සැකසහිත ආධාරක ආයතනයන්ගේ කලබලයට පත්වූ සිත්සතන් සනහාලීම සඳහා හරි ලකුණක් ලබාගත යුතු නිළධාරීවාදී පිරික්සුම් කොටුවක් නොවිය යුතු වන අතර, සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට බාධා පමුණුවන අවසන් බාධකයද නොවිය යුත්තේය. ඉන් අනතුරුව ඔවුන් විසින් සැබැවින්ම බුද්ධි ගෝචර තේරීම් සිදුකරන්නේද යන්න පාරිසරික බලපෑම් විශ්ලේෂණයක විෂයපථයෙන් පරිබාහිර වන කාරණයකි.

නවම් නයිල්ස්

SLYCAN සඳහා පරිදේශක සහකාරයෙකු වන අතර RIC හි ලන්ඩන් විශ්ව විද්‍යාල වැඩසටහනේ ගෝලීය පාරිසරික ගැටළු සහ දේශපාලනය පිළිබඳ දේශන පවත්වයි.

***Published with support from CCFD***

*Send your stories, photos and cartoons to lst.escrprogram@gmail.com Signed articles are the view of the writer*

*Published in Sinhala, Tamil & English and downloadable from http://www.lawandsocietytrust.org/resources.html*